
1 වැනි සැසිය

**මානව අවශ්‍යතා - මානව හිමිකම්**
**- මානව වගකීම්**

# ඉදිරිපත් කිරීම සඳහා කථන පිටපත


ඉදිරිපත් කිරීම සඳහා කථන පිටපත
මානව අවශ්‍යතා – මානව හිමිකම් – මානව වගකීම්

THE LOCAL
CHANGEMAKERS
COURSE

# ඉදිරිපත් කිරීම සඳහා කථන පිටපත

## මානව අවශ්‍යතා – මානව හිමිකම් – මානව වගකීම්

*1 වැනි සැසියේ මෙම කථන පිටපත අදාළ වන්නේ මෙම සැසියේ පවර්පොයින්ට් ඉදිරිපත් කිරීමෙහි අංක 7 සිට 28 දක්වා වන ස්ලයිඩ සඳහා වේ.*

**හැඳින්වීම: මානව අවශ්‍යතා**



අපි කවුරුන් වුවත්, අපගේ ආගම, ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වයස කුමක් වුවත්, අපි ජීවත් වන ස්ථානය කුමක් වුවත්, අප සියලු දෙනාට ම තියෙන්නේ එකම මූලික අවශ්‍යතා. කිසිම හේතුවක් නොමැතිව අත්අඩංගුවට ගනු ලැබීමට, වධහිංසාවන්ට ලක්වීමට හෝ වෙනස් කොට සලකනු ලැබීමට අපි කවුරුත් කැමති නැහැ. ඒ වගේම අපගේ දරුවන් කුසගින්නේ සිටිනු දැකීමට අපි කවුරුත් කැමති නැහැ. අපි හැමෝටම ඕනෑ මේ දේවල් වලින් අපව ආරක්ෂා කෙරෙන සමාජවල ජීවත් වෙන්නයි.



මිනිසුන් සියලු දෙනාට ම තියෙන්නේ එකම මූලික, පොදු අවශ්‍යතා. මෙම අවශ්‍යතා සම්පූර්ණ වුණේ නැති නම්, ශාරීරික, චිත්තවේගීය හා අධ්‍යාත්මික යහපැවැත්ම අතින් අපි පීඩාවට පත් වෙනවා.

**මානව හිමිකම්**



සෑම තැනක ම සිටින, සෑම පුද්ගලයෙකුට ම මෙම අවශ්‍යතා තිබෙන බවත්, මෙම අවශ්‍යතාවලට ගරු කරන බව සහ ඒවා සපුරාලන බව සහතික කිරීම සඳහා උපරිම වශයෙන් කටයුතු කිරීමට රජයයන්ට වගකීමක් – ඇත්ත වශයෙන් ම කියතොත් යුතුකමක් – තිබෙන බවත් ලෝකයේ ඇති රජයන් හඳුනාගෙන තිබෙනවා.




මෙය සැබෑ කර ගැනීමට උපකාර කිරීම සඳහා, ලෝකයේ තිබෙන රජයයන් විශ්ව මානව හිමිකම් පිළිබඳව, ඒ කියන්නෙ සෑම පුද්ගලයෙකුට ම තිබෙන අයිතිවාසිකම් පිළිබඳව, සහ එම අයිතිවාසිකම් වලට ගරු කිරීමට, ඒවා ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට සෑම රජයකට ම ඇති යුතුකම් පිළිබඳව එකඟත්වයකට එළඹුණා.



ඉතාමත් වැදගත් මානව හිමිකම් ගිවිසුම් තුනක් තිබෙනවා:

- මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ඉන් එකක්. අපි පෝස්ටර් භාවිතා කරමින් ඒ පිළිබඳව දැන ගත්තා. ඒ වගේම අපගේ අයිතිවාසිකම් වඩාත් ගැඹුරින් පැහැදිලි කෙරෙන තවත් විස්තරාත්මක ගිවිසුම් දෙකක් තිබෙනවා:
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR); සහ
- ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICESCR) එම ගිවිසුම් දෙකයි.

මෙම ගිවිසුම් දෙක අනුමත කරන රටවල් නීත්‍යානුකූලව එම ගිවිසුම් වලින් බැඳී සිටිනවා.



ලෝකයේ රටවල් වලින් අති මහත් බහුතරයක් මෙම ගිවිසුම් වලින් බැඳී සිටිනවා – මේ සිතියම්වල කොළ පාටින් පෙන්වන්නෙ ඒ රටවල්! මේ සියලු රටවල රජයයන් ජාත්‍යන්තර නීතිය යටතේ කරුණු 3 ක් ඉටු කිරීමට තමන්ට නීතිමය බැඳීමක් ඇති බව පිළිගෙන තිබෙනවා:




- ඔවුන් සාදන නීති වලදී සහ නිලධාරීන් ගන්නා ක්‍රියාමාර්ග වලදී මානව හිමිකම් වලට ගරු කිරීමට. උදාහරණයක් ලෙස, වෙනස්කොට සලකන ආකාරයේ නීති නොතිබිය යුතු අතර කිසිවෙකු වධ හිංසාවලට ලක් නොකළ යුතුයි.
- රජය විසින් හෝ වෙනත් අයෙකු විසින් තමන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබූ විට සෑම අයෙකුට ම යුක්තිය ඉටු කර ගත හැකි බවට සහතික කරමින් මානව හිමිකම් ආරක්ෂා කිරීමට; සහ
- සෑම අයෙකුට ම තමන්ගේ අයිතිවාසිකම්වලට ප්‍රවේශය ලැබෙන බව සහතික කිරීමට උපරිම ලෙස කටයුතු කරමින් මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට. උදාහරණයක් ලෙස, සෑම කෙනෙකුට ම සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීමට උපරිම වශයෙන් කටයුතු කළ යුතුයි. ඇත්ත වශයෙන් ම, සෑම රජයකට ම එක හා සමාන ලෙස සම්පත් නැහැ. එනිසා මෙම සමාජ හා ආර්ථික අයිතිවාසිකම් සැබෑ කිරීම ක්‍රම ක්‍රමයෙන් සිදුවන ක්‍රියාවලියක්.




සෑම මිනිසෙකුට ම මෙම අයිතිවාසිකම් එක හා සමානව ඇති බවට රජයයන් එකඟ වී තිබෙනවා. "සියලු මනුෂ්‍යයින් නිදහස් මනුෂ්‍යයින් ලෙස උපත ලබන අතර ඔවුන් ගෞරවය හා අයිතිවාසිකම් වලින් එක හා සමාන වේ" යනුවෙන් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ පළමු වැනි වගන්තියේ ම සඳහන් වෙනවා.



නමුත්, බොහෝ රජයයන් මෙම බැඳීම් ඉටු නොකිරීම කණගාටුවට කරුණක් – බොහෝ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වෙනවා. කාන්තාවන්, ගැහැණු ළමයින්, සුළුතර කණ්ඩායම්, ආබාධ සහිත පුද්ගලයින් සහ සංක්‍රමණිකයින් විශේෂයෙන් ම අයිතිවාසිකම් උල්ලංඝනයවීම් වලට ගොදුරු වෙනවා. ලෝකයේ සෑම රටක ම සිදුවන උල්ලංඝනයවීමකට පොදු උදාහරණයක් තමයි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් හිංසනය.

**මානව හිමිකම් පිළිබඳ විග්‍රහය**




රජයයන් අයිතිවාසිකම් උල්ලංඝනය කරන විට හෝ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් වලින් ජනතාව ආරක්ෂා කිරීමට රජයයන් අපොහොසත් වන විට පැමිණ එම රජයයන්ට දඬුවම් කිරීම සඳහා ගෝලීය පොලිස් බලකායක් නැහැ. මානව හිමිකම් අනුගමනය කරන්නට කියා රජයයන්ට බල කිරීමට එවැනි ජාත්‍යන්තර පොලිස් බලකායක් නොමැති නම්, මානව හිමිකම් කියන්නේ, සැබෑ බලයක් නැති, වෙනසක් ඇතිකිරීමට තිබෙන ඵලදායී මෙවලමකට වඩා, කඩදාසියක ලියැවුණු වචන පෙළක් පමණක් නොවෙයිද?



එසේ කීමෙහි යම් සත්‍යතාවයක් ද තියෙනවා – සමහර රජයයන්ට බලපෑම් කිරීම ඉතා අපහසුයි. ඒත්, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව ජාත්‍යන්තර හා දේශීය වශයෙන් සිදු කෙරෙන විවේචන බොහෝ රටවල ධනාත්මක වෙනසක් ඇති කිරීමට හේතු වී තිබෙනවා. ජාත්‍යන්තර පොලිස් බලකායක් නොමැතිව වුවත් මානව හිමිකම් ප්‍රවර්ධනය කරන්නට හැකි බොහෝ ක්‍රම තිබෙනවා.



මිනිසුන් මානව හිමිකම් විවේචනය කිරීමට තවත් හේතු කිහිපයක් තිබෙනවා. සමහර විට ඔබට ද මෙවැනි සිතුවිලි ඇතිවී තිබෙනවා වෙන්නට පුළුවනි:

- සමහරවිට මානව හිමිකම් කියන්නේ හරිම තාක්ෂණික දෙයක් කියා ඔබට සිතෙන්නට ඇති – ඒ කියන්නේ මානව හිමිකම් ඔබට සම්බන්ධයක් තිබිය හැකි දෙයක් නොව එය නීතිඥයින්ට සහ දේශපාලනඥයින්ට මාතෘකාවක් යැයි ඔබට සිතෙන්නට ඇති.
- එහෙම නැත්නම්, සමහරවිට මානව හිමිකම් කියන්නේ ඔබගේ දෛනික ජීවිතයට බොහෝ සෙයින් දුරස්ථ දෙයක් කියා, ඒ කියන්නේ විශාල නගරවල ප්‍රභූ පැලැන්තියට අයත් පුද්ගලයින්ට විමසිලිමත් විය හැකි දෙයක් කියා ඔබට සිතෙන්නට ඇති.
- එසේත් නැති නම්, සමහරවිට මානව හිමිකම් කියන්නේ ගෝලීය දේශපාලන ක්‍රීඩාවක ආයුධයක් ලෙස ඔබට පෙනෙන්නට ඇති. ඒ කියන්නෙ සමහර රජයන් මානව හිමිකම් උල්ලංඝනය කරන අතර ම කුහක ලෙස සතුරන් විවේචනය කිරීමට ද මානව හිමිකම් භාවිතා කරන්නේ ය කියා ඔබට සිතෙන්නට ඇති.

හොඳයි, මානව හිමිකම් කියන්නේ නීතිය සම්බන්ධ දෙයක්; දේශපාලනඥයින් නීති හදනවා; නීතිඥයින්ට අධිකරණය හරහා මානව හිමිකම් වෙනුවෙන් සටන් කළ හැකියි. ඒක ඇත්ත, මානව හිමිකම් කියන යෙදුම සමහර විට දේශපාලන අරමුණු සඳහා යොදා ගෙන අවභාවිතා කරනවා. නමුත් මානව හිමිකම් කියන්නේ ඊට වඩා බොහෝ පුළුල් දෙයක්!

## මානව හිමිකම් සහ අපි



අපි දැන් තේරුම් ගත් ආකාරයට, මානව හිමිකම් වලින් කථා කරන්නේ ඇත්ත වශයෙන් ම අපගේ එදිනෙදා ජීවිතයේ අපට ඇති අවශ්‍යතා පිළිබඳව යි; අපේ පාසලේ, ගොවිපළේ, සේවා ස්ථානයේ, නිවසේ සහ අවට ප්‍රදේශයේ සිදුවන දේ පිළිබඳවයි; අපි එකිනෙකාට සැලකිය යුතු ආකාරය හා අපට සලකනු ලැබිය යුතු ආකාරය පිළිබඳවයි; අපගේ ජීවිත සම්බන්ධයෙන් බලය තිබෙන අය විසින්, ඒ කියන්නේ ඉඩම් හිමියන්, සේවා යෝජකයින්, ගුරුවරුන් වැනි අය විතරක් නොවෙයි අපේ පවුලේ සාමාජිකයින් විසින් පවා, සහ ඇත්ත වශයෙන් ම, පොලීසිය, උසාවි, හමුදාව සහ රජය වැනි බලධාරීන් විසින් ද අපව අපයෝජනයට ලක් කරනු ලැබීමෙන් අපව ආරක්ෂා කිරීම පිළිබඳවයි.

සමහර විට අපට එය මෙන්නෙ මේ විදිහට කෙටියෙන් කිව හැකියි: මානව හිමිකම් වලින් කථා කරන්නේ අප ජීවත් වීමට කැමති ආකාරයේ සහ අප එක්ව වැඩ කර ගොඩනැඟීමට කැමති ආකාරයේ සමාජය පිළිබඳවයි.

අපගේ ප්‍රජාවන් තුළ මානව හිමිකම් සැබෑ කර ගැනීමට නම්, අපි සියලු දෙනා ම ඉටු කළ යුතු කාර්යභාරයක් තිබෙනවා. බොහෝ මානව හිමිකම් උල්ලංඝනයවීම් සිදුවෙන්නේ සාමාන්‍ය ජනතාව අන් අයගේ අයිතිවාසිකම් වලට ගරු නොකරන නිසායි. උදාහරණයක් විදිහට අපි සමහර පුද්ගලයින්ට අප හා සමාන අය ලෙස නොසලකන නිසා. ඒ වාගේම මිනිසුන් එකිනෙකා වෙනුවෙන් නැගී නොසිටින නිසා, දේවල් වෙනස් කිරීමට උත්සාහ නොකරන නිසා සහ අපි බොහෝ විට නිහඬව සිටින නිසා රජයයන්ට, ව්‍යාපාරවලට සහ පුද්ගලයින්ට මානව හිමිකම් උල්ලංඝනය කිරීම් දිගින් දිගටම සිදු කරගෙන යන්නට හැකිවී තිබෙනවා.

---




අපි ආණ්ඩු නොවෙයි – අපි ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් අත්සන් කරලා නැහැ; මානව හිමිකම් අනුගමනය කරන බව සහතික කිරීමට අපට නීතිමය වගකීමක් නැහැ. නමුත් අපි තර්කානුකූලව හා හෘදය සාක්ෂියට එකඟව හිතා බැලුවොත් අපි සියලු දෙනා මනුෂ්‍යයින්. එම නිසා අපි එකිනෙකාට සදාචාරාත්මක යුතුකමක් තිබෙනවා. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ මෙහෙම සඳහන් වෙනවා:

> "සියලු ම මිනිසුන් ගෞරවය හා අයිතිවාසිකම් අතින් එක සමානව උපත ලබයි. ඔවුන්ට විචාරය සහ හෘදය සාක්ෂිය උරුමව ඇති අතර ඔවුන් එකිනෙකා කෙරෙහි සහෝදරත්වයේ හැඟීමකින් යුතුව ක්‍රියා කළ යුතු යි."

> "... සෑම පුද්ගලයෙක් ම සහ සමාජයේ සෑම අංශයක් ම [...] ඉගැන්වීම හා දැනුවත් කිරීම මගින් මෙම අයිතිවාසිකම් වලට සහ නිදහසට ගරු කිරීම ප්‍රවර්ධනය කිරීමට ප්‍රයත්න දැරිය යුතු ය."

අන් අයගේ ජීවිතවලට යහපතක් හෝ අයහපතක් කිරීමට අපට බලය ඇති විට, අපට මානව හිමිකම් ආරක්ෂා කිරීමේ සදාචාරාත්මක වගකීමක් තිබෙනවා. අපට හැම දෙයක්ම කරන්න බැහැ – සමහර අවස්ථාවල අපට කළ හැකි කිසිම දෙයක් ගැන සිතා ගැනීමටත් බැරි වෙනවා – නමුත් අයුක්තියක් සිදුවන බව අපට පෙනෙන විට, ඒ සම්බන්ධයෙන් යමක් කළ හැකි නම්, අපි එය කිරීමට උත්සාහ කිරීම අපේ සදාචාරාත්මක යුතුකමක් වෙන්න පුළුවන්.

යමක් කිරීම හොඳ අසල්වැසියෙකු වීම තරම් සරල දෙයක් වෙන්න පුළුවනි.

## සමාජ පරිවර්තකයින් පිළිබඳ කතා



ෂෆාක් හසන් කියන්නෙ දකුණු ලන්ඩනයේ වෙසෙන බ්‍රිතාන්‍ය ජාතික මුස්ලිම් කාන්තාවක්. පසුගිය කාලයේ දී එක්සත් රාජධානියේ වෛරී අපරාධ විශාල වශයෙන් ඉහළ ගිහින් තියෙනවා. මුස්ලිම්වරු සහ විශේෂයෙන් ම හිස ආවරණ පළඳින මුස්ලිම් කාන්තාවන් (ෂෆාක් වගේ) බොහෝ විට අන්තර්ජාලයේ දී වගේම මහා මාර්ගයේදීත් ඉලක්ක බවට පත් වෙනවා. මෙවැනි වාතාවරණයක් තුළ, විවිධ ඇදහිලි සහිත ප්‍රජාවන් අතර එදිනෙදා සිදු කෙරෙන මිත්‍රශීලී සහ ත්‍යාගශීලී ක්‍රියා බොහෝ සෙයින් අර්ථවත් විය හැකියි.

ෂෆාක් ගේ මුස්ලිම් නොවන අසල්වැසියා ඇය නොහිතපු විදියට ඇයට සහ ඇයගේ 14 හැවිරිදි පුතා අයාන් ට ඊද් උත්සවය සමරන්න තෑගි දුන් විට මනුෂ්‍යත්වය පිළිබඳ ඇය තුළ තිබූ විශ්වාසය නැවතත් යථා තත්වයට පත් වුණු බව ෂෆාක් කියනවා.



ෂෆාක් එයාලට ලැබුණු තෑගිවල ෆොටෝ එකක් ට්විටර් එකට දාලා මෙහෙම කියලා තිබුණා

"මුස්ලිම් කෙනෙක් නොවෙන අපේ අසල්වැසියා අපිට ඇල්ජේරියන් රටඉඳියි, සම්පූර්ණ මාසය පුරා ම උපවාසයේ යෙදුණු මගේ 14 හැවිරිදි පුතාට යාච්ඤා කරන්න කලාලයකුයි තෑගි කළේ අපි පුදුමයට පත් කරමින්. එයා අවුරුදු විස්සකට වැඩි කාලයක් අපගේ අසල්වැසියා වෙලා හිටියත් ඊද් තෑගි වලින් අපව සම්පූර්ණයෙන් ම පුදුම කළා."

"අයාන් උපවාසයේ යෙදෙන බව එයාට තේරිලා තිබුණා කියා මට දැනුණේ නැහැ. මේ සිදුවීමෙන් මගේ පුතාට ඇත්තට ම තමන් විශේෂයි කියලා දැනුණා. එයාලා අපිත් එක්ක හිතවත් අසල්වැසියන්; එයාලා මගේ අම්මා හදන බුරියානිවලට කැමති නිසා අපි සෑම විටම එයාලට බුරියානි පෙට්ටියක් යවනවා. අපි වෙනස් ප්‍රජාවන්ට අයිති වුනත්, අපේ අසල්වැසියා අයාන් ගැනයි ආගමික විශ්වාසය ගැනයි ඒ තරමට ම කල්පනාකාරී වෙලා අයාන්ව ධෛර්යමත් කරපු එක හදවත උණුසුම් කරවන දෙයක්."

---



සාලිහා සහ මැග්ඩලීනා කියන්නේත් ඉතා වෙනස් වාතාවරණයක් තුළ වෙනසක් සිදු කරමින් සිටින අය. සාලිහා කියන්නේ සැන්සිබාර් දූපත් සමූහයේ පෙම්බා කියන දූපතේ ඉන්න සැදැහැවත් මුස්ලිම්වරියක් මෙන්ම මිත්තනියක්. ඇය එම ප්‍රදේශයේ මදුසා පාසලේ උගන්වනවා.

---



සාලිහා මෙහෙම කියනවා

"අපේ ප්‍රජාවන් අතරෙ තිබෙන නොසන්සුන්තාවය ගැන මම කනස්සල්ලෙන් ඉන්නෙ. අපේ තරුණ අයට අපේ දේශපාලන නායකයන් ගැන විශ්වාසයක් නැහැ. එයාලට අවස්ථා ලැබෙන්නෙ නැහැ."

---



ඇය තවත් මෙහෙම කියනවා,

"සංචාරක අංශයේ රැකියා කරන්න ප්‍රධාන භූමි ප්‍රදේශයේ ඉඳලා මෙහෙට එන වැඩි දෙනෙක් ක්‍රිස්තියානි අය. මම දන්න මුස්ලිම් අය බොහෝ දෙනෙක් තමන්ට කරන්න තියෙන රැකියා ක්‍රිස්තියානි අය ඇවිත් අරගන්න එක ගැන දොස් කියනවා. මම අවුරුදු ගණනාවක් තිස්සේ පැවතුණු දේශපාලන නොසන්සුන්තාවය සහ ආගමික කලබලකාරී තත්ත්වය අත්විඳල තියෙනවා. පල්ලි ගිනිබත් කරනවා, වෛරී කථා සහිත පත්‍රිකා බෙදා හරිනවා, පල්ලියට යන පාරෙදි ක්‍රිස්තියානි අයට හිරිහැර කරනවා මම දැකල තියෙනවා. අපේ තරුණ අය වඩාත් රැඩිකල් වෙමින් සිටින බව දැකීමෙන් මම කනස්සල්ලට පත්වෙලා ඉන්නෙ. ඒ නිසා තමයි මම කාන්තාවන්ගෙ අන්තර් ආගමික කමිටුවට බැඳුණේ."

---



"මම අපේ දූපතේ ආගමික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට උදව් කරන්න කැමතියි. මදුසා පාසැලේදී මම දරුවන්ට උගන්වන්නේ ඉවසීම සහ ආදරය අපේ ආගමේ මූලික අංග බවයි. අනාගතය තියෙන්නේ අපේ දරුවන් අතේ; ඒ නිසා ඔවුන්ට හරි මාර්ගය පෙන්වීම තමයි අපේ වගකීම."



ප්‍රධාන භූමි ප්‍රදේශයේ ඉඳලා සැන්සිබාර් දූපතේ පදිංචියට ගිය ක්‍රිස්තියානි කාන්තාවක් වන මැග්ඩලීනා ද අන්තර් ආගමික කටයුතුවල නිරත වෙනවා. ඇය අඳින පළඳින ආකාරයත් ඇයගේ ආගමත් නිසා ඇය වෙනස්කොට සලකනු ලැබීමට මුහුණ දීලා තියෙනවා. ඒ වුනත් ඇය ක්‍රිස්තියානි අයයි මුස්ලිම් අයයි අතර තියෙන භේදය තුරන් කිරීමට අධිෂ්ඨාන කරගෙන ඉන්නෙ. ඇය අන්තර් ආගමික අභියෝග ගැනත් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ගැනත් කතා කිරීමට ප්‍රජාවන් අතරට යන සංවිධානයක් වන උන්ගෝයා ප්‍රාදේශීය කාන්තා කවුන්සිලයට සම්බන්ධ වුණා.

> “මම කම්ටුවට බැඳුණේ ඉස්ලාම් ගැන වැඩිදුරටත් ඉගෙන ගෙන මුස්ලිම්වරුන් ජීවත් වන ආකාරය අවබෝධ කර ගැනීමටයි” යනුවෙන් ඇය පැහැදිලි කරනවා. ”අපි හැමෝම කාන්තාවන්. ඒ නිසා අපි හැමෝම වෙනස්කොට සැලකීම්වලට මුහුණ දෙනවා – අපි එකට එක්ව එකිනෙකාට සහයෝගය දැක්විය යුතුයි.”

---



ෂෆාක්ගේ අසල්වැසියා සහ සාලිහා සහ මැග්ඩලීනා වැනි අය ගණන් කරන්න බැරි තරම් සංඛ්‍යාවක් ඉන්නවා. තමන් සිටින ප්‍රජාවන් තුළ තමන්ගේම පුංචි ක්‍රමවලින් මානව හිමිකම් යථාර්ථයක් බවට පත් කිරීමට උත්සාහ කරන අපි වගේ සාමාන්‍ය මිනිස්සු – ප්‍රාදේශීය සමාජ පරිවර්තකයින්!

අපි කවුරුන් වුනත්, මානව හිමිකම් යථාර්ථයක් බවට පත් කිරීමට අපිටත් යමක් කළ හැකියි!

**මූලාශ්‍ර:**

Faith Matters www.faith-matters.org
https://www.faith-matters.org/family-surprised-by-presents-from-non-muslim-neighbour-to-celebrate-eid/
Zanzibar Inter-faith Centre (ZANZIC)
https://www.facebook.com/ZanzicMeansPeace/
https://english.danmission.dk/project/zanzibar-peacebuilding-through-interfaith-dialogue/